**මෙතෙක් කතාව**

උසස් අධ්‍යාපනයා ඔස්ට්‍රේලියාවට එන මට විශ්ව විද්‍යාලයයේදි ගුරුසිංහ ඇමතිවරයාගේ පුතා වන අශේන් හමුවෙයි. අන්තර්ජාලයේදී මට හමුවන විශ්වත් මගේ මාමාගේ පුතා වන සුනෙත් අයියාත් මගේ දිවියේදී මා හා සමාන්තරව යමින් සිටියි. අම්මා සිය දෙවන විවාහයේ සැමියා වන ජයසිරි අංකල් සමග ඔස්ට්‍රේලියාවට එන්නේ මේ අතරේදීය ජයසිරි අංකල් අශේන්ගේ ඥාතියෙකි. තාත්තා ගුරුසිංහ ඇමතිට එරෙහිව ඡන්ද ව්‍යාපාරයට එයි. අප ගිය විනෝද සවාරියක 'දී නැන්දා සහ ජයසිරි අංකල් හැසිරුණේ යම් සැකයක් ඇති වන පරිදි ය. සුනෙත් අයියා නිවසෙන් යන්නට ගියේ මේ කාරණය නිසා ය. විශ්ව තමා විවාහ වූ බව හදිසියේම දවසක කියයි. සුනෙත් අයියා අමන්දා නම් තරුණිය හා හිතුවක්කාර ලෙස විවාහ වූ බව ඇසූ මාමා කෝප වෙයි. නැන්දාගේ අනියම් සම්බන්ධය පිළිබඳව මාමා ඈ සමග කලහ කරගෙන නිවසින් පිටව යයි. එදා මාමා අනතුරකට ලක්ව මිය යයි. ජයසිරි අංකල්ගේ බලපෑමෙන් මිදන්නට මම නිවසින් පිටවුණෙමි. එදා රැයේ අම්මා වැඩියෙන් නිදි පෙති පානය කිරී ම නිසා රෝහල් ගත කරයි

**අද එතැන් සිට**

අශේන් වාහනය පදවන්නේ ඉතා සෙමින් යැයි මට සිතෙයි. මා වරින් වර වාහනයේ වේගමානය දෙස බැලුවේ එනිසා ය.

“අනේ ඉක්මනට යමු අශේන්..“ මම ඉවසා බැරිම තැන කීවෙමි.
“මෙයිට වඩා ස්පීඩ් යන්නෙ කොහොමද කෞෂි...? පේන්නැද්ද මං දැනටමත් කිලෝ මීටර් දහයක් වැඩියෙන් ඩ්‍රයිව් කරන්නෙ....“ ඔහු කීවේ නුරුස්නා හඬිනි. මම නිහඬ වීමි. ඔහු නිවැරදි බව මට පෙනෙයි.

“හිත කලබල කරගන්න එපා....“ ඔහු සිය වමත මගේ සුරත මත තැබුවේ ය.
ඉවසීමේ බැම් බිඳ ගියෙන් මම හඬන්නට වීමි අශේන් හිස හරවා වා දෙස බැළුවේ ය. .

“අඬන්න එපා... කලබල නොවී කරන්න පුළුවන් යමක් තියෙනවද කියල බලමු...“ ඔහු නැවතත් කීවේ ය.
නොහඬා කුමක් කරන්න දැයි මට නොවැටහේ. මේ විනාශ වෙමින් පවතින්නේ අපේ ජීවිතයි.

අශේන් පසු පසින් එන්නේ දැයි නොබලාම මම රෝහල් කොරිඩෝව දිගේ දුවමින් සිටියෙමි. පරිසරය ගැන හෝ අවට සිටින්නන් පිළිබඳව හෝ කිසිදු හැඟීමක් මට නොවී ය.

“කෞෂි..“ අශේන් ගේ කට හඬ වරින් වර පසුපසින් ඇසුණා බව මට මතකය. එනමුදු ඔහු වෙනුවෙන් නැවතෙන්නට මට හැකියාවක් නොවී ය. මම අම්මා සොයා දුව ගියෙමි.

“අම්මේ.. මං කෞෂී..“ මං අම්මාගේ ඇඳ අසළ නැවතී මිමිණුවෙමි. ඇය සුවදායක නිද්‍රාවකට වැටී සිටිනු මට පෙනෙයි. අම්මා කොයි මොහොතේ හෝ ඇස් ඇර මා සෙස බළනු ඇතියි මම සිතුවෙමි. ඇස් ඇර මා දෙස බලා “.. මගේ පුතා...“ යි මා වැළඳ ගනු ඇතැයි මම බලාපොරොත්තු දල්වාගෙන බලා සිටියෙමි. බොහෝ ඈත අතීතයේ මා හිස සිය ළමැදට තුරුළු කරගෙන සිය අතැඟිලි මගේ හිසකෙස් අතර දවටමින් “.. මගේ රත්තරන් පුතා ..““ යි කියූ සේ ඈ නැවත කතා කරනු ඇතැයි මම බලා සිටියෙමි.

“අම්මේ.. මං ආවා..“ මම ඇගේ සීතල අතින් අල්ලා ගතිමි. වෙනදා ඇගේ අතක වූ සුවදායී උණුසුම ඒ මොහොතේ මට නොදැනුනි. මම ඇගේ අප්‍රාණික අත දෝතින්ම ගෙන සිප ගත්තෙමි. මගේ කඳුලේ උණුසුම ඇයට දැනෙන්නට නැත. දැනුණා නම් ඇය විගසින් ඇසි ඇර බලනු ඇත.

මා කොපමණ වේලාවක් ඇගේ දෙඅත් අල්ලාගෙන සිටියාදැයි කියන්නට නිනව්වක් මට නොවී ය. අශේන් පිටුපසින් පැමිණ මගේ දෙවුරහිසින් අල්ලා ගන්නා තෙක්ම මම අම්මා අසළ සිට හැඬුවෙමි.
“කෞෂි ...“ ඔහු මිමිනුවේ ය. “.. අපි යමු...“

මම ඔහුට අවනත නොවී මි. මට අම්මා හැර යා නොහැක. මේ හුදකලා කොදෙව්වේ ඇයට සිටින්නේ මා පමණකි. ඈ මෙතැන තනි කර දමා යන්නට මගේ සිත මට ඉඩ නොදෙයි.

“කෞෂි... අපි ගිහින් මොනවා හරි බීලා එමු...“ ම දෙවුරහිස වටා දවටා ගත් සුරතින් මා තමා වෙතට ඇද ගනිමින් අශේන් කීවේ ය. මගේ අකීකරු දෙපා අද්දවමින් මම ඔහු සමග ගමන් කළෙමි. සැබැවින්ම මා ගියා නොව, ඔහු මා ඇදගෙන ගියේය.
මම ආපසු හැරී අම්මා දෙස බැලුවෙමි. ඈ කිසිවක් නොඇසුණ කනින් කිසිවක් නොදැනුණ ගතින් තමාගේම ලෝකයකට වැදී සිටියා ය.

“අනේ අශේන්.. මම කෙඳිරුවෙමි .. මට යන්න බෑ..“
“අපට යන්න වෙනවා කෞෂි...“ අශේන් දැඩිව කීවේ ය.
“ඇයි..?“ මම ඇසුවෙමි. ඔහු පිළිතුරු නොදුන් නේ ය.
ආපන ශාලාවේ කෙළවරක මේසයක මා වාඩි කරවූ ඔහු බොන්නනට යමක් ගෙනෙන්නට ගියේ ය. මම මේසයට හිස ගසා ගත්තෙමි. අම්මා නැවත නොනැගිටිනු ඇතැයි මගේ සිත කියයි. ඈ වෙනුවෙන් යමක් කළ නොහැකිය යන සිතිවිල්ල පවා දරා ගත නොහැකි බරක්ව ඇත.

වරෙක ඇය අපේ ජීවිත වලින් ඈත්ව තමාගේම ගමනක් ගියා ය. එනමුදු ඈ වෙනුවෙන් මසිතේ වූ ආදරය එක දශමයකිනුදු වෙනස් නොවූයේ ය. ඕ මගේ අම්මා ය. නිදි මත වූ විට මා තුරුළු කර ගෙන සුරංගනා කතා කියා දුන්නේ ඈ ය.

“නිල් අහස් තලේ අගේ නෑ වළාකුළු ලස්සනයි පුරා හඳේ රැස් විහිදිලා“ යි මා සමඟ ගැයුවේ ඇය ය.

උදෑසන සුදු ඇඳුම අන්දවා කොණ්ඩය පිරා කරල් දෙකකට ගොතා පාසල් යන්නට මා සූදානම් කළේ ඈ ය. මා වාහනයට නගින තුරු දොරකඩට වී අත වැනුවේ ඈ ය. දඟකාර කමින් අතපය තුවාල කර ගත් විට කඳුලු සළමින් බෙහෙත් දැම්මේ ඈ ය.

ඇය තාත්තා සමඟ ගැටුම් ඇති කරගත් කාලය මට සිහිවෙයි. මේ සියළු වනසනයේ ඇරඹුම එතැන නොවේ ද? ජයසිරි අංකල් සමඟ යන තීරණයට දක්වා ඇය මෙහෙයවන්නට බොහෝ හේතු කාරණා වූ බව සැබෑ ය. එතැනදී අම්මා අත වරද පටවා තාත්තා නිදොස් කරන්නට මා සූදානම් නැත. නමුදු මම එක දෙයක් පැහැදිළිව දැන සිටියෙමි. ඇගේ සිත තුළ මා කෙරෙහි වූ ආදරය කිසි දාක එක දශමයකිනුදු අඩු නොවූ බවය.

අශේන්ගේ අතෙහි පහස මගේ හිස මත දැනෙයි.

“කෞෂි.. මේ තේ එක බොන්න.. “

මම හිස ඔසවා ඔහු දෙස බැළුවෙමි. “අශේන්.. මගේ අම්මා නැති වෙයිද..?“

ඔහු පිළිතුරක් නොදුන්නේ ය. ඔහුගේ පිළිතුර කුමක්දැයි මම දනිමි. ඔහු නිවැරදිය එදා සැන්දෑවේ, අම්මා මිය ගිය පුවත මම දුරකථනයෙන් ඇසුවෙමි. මම රිසිවරය අත තබාගෙන ම අශේන් දෙසට හැරුණෙමි.

ඔහු සිටියේ මට ඇහුම් කන් දෙන්නට තරම් පැහැදිළි මානසිකත්වයක නොවන බව මම දුටුවෙමි..

“ඇ.. ඇයි..අශේන්.. මොකද මේ..?“ මා ඇසුවේ බලා සිටින්නට බැරිම තැන ය. ඔහු කිසිවක් නොකීවේ ය. කුස්සි කබඩයේ වූ කුඩා බෝතල කුප්පිය විවර කළ ඔහු එතුළින් ගත් කුඩා පෙත්තක් කටේ දමා ගත්තේ ය. ඉන්පසු ඔහු මදෙස නොබලා ම ගෙයින් පිට ව ගියේ ය.

මගේ හිස දැන් පුපුරා යනු ඇතැයි මට සිතෙයි. කිසිවක් සිතා ගත නොහැකිව මම අසරණව සිටියෙමි. අශේන් අසනීපයෙන් ද? ඔහු ඒ බව මගෙන් සඟවන්නේ ඇයි? මම පැන්ට්‍රිය අසළ බිම වාඩි වී දෙදණ අතර හිස ගසා ගත්තෙමි. කෙළවරක් නැති අඳුරු අගාධයක පතුළට මා වැටෙමින් සිටින්නේ යයි මට සිතෙයි. නිදැල්ලේ වැටෙන්නට ඉඩ හරිනවා වෙනුවට මට කළ හැකි වෙනත් යමක් නැතැයි මට සිතෙයි.

සිහි එළවා ගත හැකි වූ පළමු අවස්ථාවේම මම තාත්තාට දුරකථනයෙන් කතා කළෙමි.

“තාත්තේ..“ මම වචන සොයමින් වෙහෙසුණෙමි..
“අනේ තාත්තේ...“

“කලබල වෙන්න එපා මගේ පුතා...“ තාත්තා කතා කළේ බොහෝ නිවුණ හඬිනි. “... මම ඔක්කොම දන්නවා... මට මේ දැන් නැන්දා කතා කළා...“

“අනේ තාත්තේ අපේ අම්මා...“ .

“දූ.. මටත් කණගාටුයි... හැම දේම සිදුවුණේ මහා අවාසනාවන්ත විදිහට... පුතා හිත කලබල කරගන්න එපා... ඔයා පොඩි ළමයෙක් නෙවෙයි නෙ... මේ වගේ දේවල් වලට අපට ජීවිතේ දි මූණ දෙන්න වෙනවා..“ තාත්තා ටික වේලවක් නිහඬව සිටියේ ය. මා යමක් කියනු ඇතැයි ඔහු බලාපොරොත්තු වන්නට ඇත. එහෙත් යමක් කියන්නට තරම් එකලාසයක් මගේ හිතට නොවී ය.

“මං කැමතියි දූ ආපහු එනවනං...“ ඔහු කිවේ ය. “..එත් මේ තරම් මහන්සි වෙච්ච එකේ අන්තිම විබාගෙ නොකර එන්න කියන්න මගේ හිත දෙන්නෙ නැහැ.. ඒ නිසා ඔය මාස දෙක තුනත් කොහොම හරි හිත හදාගෙන ඉන්න බලන්න.. ඔයා අහගෙනද ඉන්නෙ..?“

“හ්ම්.. “
“දූ.. හැමතිස්සෙම හිතන්න ඔයා වෙනුවෙන් තාත්තා ඉන්නවයි කියලා.. අම්මා දාල ගිය දවසෙ ඉඳන් මං මලක් වගේ ඔයාව හැදුවා... ඉදිරියටත් මං ඔයා වෙනුවෙන් ඉන්නවා.. මගේ දුව.. කිසිම දෙයකින් සැළෙන්න එපා.. ජීවිතේ කටුකයි තමයි.. අපි නොහිතන දුක් වේදනා විඳින්න වෙනවා.. ඒත් ඒකටම තමයි ජීවිතේ කියන්නෙ.. අපට යන්න ගමනක් තියෙනවා.. අපි ඒ ගමන යන්න ඕනෙ.. මොන දුක කම්කටොළු ආවත් අපි අපේ ගමන යන්න ඕනෙ.. තේරුණාද..? හිත හදාගන්න.. කලබල වෙන්න එපා.. ඕනෙම වෙලාවක මට කතා කරන්න.. “

තාත්තාගේ වචන මගේ දුර්වල සිතට මහත් ශක්තියක් විය. ඔහු කියන්නේ සැබෑවකි. දැන් මා ජීවිතයට මුහුණ දිය යුතු ය. පළමුව සිත තැන්පත් කර ගත යුතු ය. කාලය විසින් සියල්ල විසඳනු ඇත.

අශේන් ගෙදර ආවේ බෙහෝ රෑ බෝ වූ පසුව ය. සවස සිටියාට වඩා වැඩි තැන්පත් බවක් ඔහු කෙරන් දිස් විය.

“ඔයාට මොකද වුණේ අශේන්..?“ මම ඇසුවෙමි.

ඔහු කිසිවක් නොකියා වාඩි වී සිටි මා අසළට පැමිණ බිම දණ ගසා සිය හිස මගේ පපුවට තබා ගත්තේ ය. මම මහත් වූ සෙනෙහෙසකින් ඔහුගේ සිහ පිරි මැද්දෙමි.

“ඔයාට දැන් සනීපද..?“ මම ඇසුවෙමි. ඔහු පිළිතුරු දුන්නේ නැත. ඔහු හඬන්නේ යයි මට සිතුණි. මම දෑතින්ම ඔහුගේ සිහ එසෙව්වෙමි. මා නිවැරදිය. ඔහුගේ දෑස් පුරා කඳුළු පිරී තිබුණි.
“අශේන්.. අනේ ඇයි මේ..? ඇයි ඔයා මේ අඬන්නේ..? මට කියන්න බැරි දෙයක් ඔයා ළඟ තියෙනවද..?“
ඔහු මට පිළිතුරු දෙන්නට නොවෙහෙසුණේ ය. මම නොයිවසිල්ලන් ඔහු දෙස බලා සිටියෙමි.

“ඔයාට සනීප නැද්ද අශේන්... ? අනේ මට කියන්න..“ මම බැගෑපත් වීමි. ඔහු මා දෙස ඇසි පිය නොහෙලා බලා සිටියේ ය.

“මට සමාවෙන්න කෞෂි..“ සෑහෙන වේලාවකට පසු ඔහු කීවේ ය.

ඇයි..? සමාව ඉල්ලන්නෙ මොකටද..? ඔයා රෑට කාලා නෑ නේද..? මගේ ප්‍රශ්නයට පිළිතුරු දෙනු වෙනුවට ඔහු

31 පිටට

